චක්‍රලේඛ අංක : 02/2023

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 , ජනපය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර ,
රාජගිරිය.
2023.01. 10

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමුපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත.

<u>සමුපකාර සේවකයින් සඳහා ගෙවනු ලබන දීමනා සංශෝධනය.</u>

රටේ පවතින වත්මන් ආර්ථික තත්වය පදනම් කර ගනිමින් සමුපකාර සමිති මගින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ඉල්ලීම් සලකා බලා විවිධ කොමිෂන් සභා චක්‍රලේඛ අනුව ලබා දී ඇති පහත දීමනා (V) තිරයේ පරිදි සංශෝධනය කර ඇති බව කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

| (I) අනු අංකය | (II) දීමනා වර්ගය | (III) අදාල කොමිෂන් සභා චක්‍රලේඛය | (IV) දැනට ගෙවනු ලබන දීමනාව | (V) සංශෝධිත දීමනාව |
|---|---|---|---|---|
| 01. | අවදානම් දීමනාව. | 02/2021 හා 02/2021 (1) | රු. 150.00 | රු. 200.00 |
| 02. | සංයුක්ත දීමනාව. (පැය 12 කට නොඅඩු කාලයක් සඳහා) | 02/2018 | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම - රු. 450.00<br>කළමනාකරණ මට්ටම - රු. 400.00<br>අධීක්ෂණ සහ මෙහෙයුම් මට්ටම - රු. 350.00<br>කණිෂ්ඨ කාර්ය මණ්ඩලය - රු. 300.00 | රු. 550.00<br>රු. 500.00<br>රු. 450.00<br>රු. 400.00 |
| 03. | යතුරු පැදි දීමනාව | 06/2022 | රු . 15.00 | රු. 30.00 |

02. ඉහත පරිදි දීමනා ප්‍රමාණයන් වැඩි කිරීම තුළින්, සමුපකාර සමතිවල මූල්‍ය තත්ත්වයට හා ලාභදායිත්වයට අහිතකර ලෙස බලපෑමක් සිදු වන්නේ නම් (IV) තිරයේ පරිදි දැනට ගෙවනු ලබන දීමනාව එලෙසින්ම ගෙවීම සඳහා තීරණය කිරීමේ හැකියාවද අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතින බව වැඩි දුරටත් දැනුම් දෙමි.

03. මෙම චක්‍රලේඛය බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ එකඟතාවය මත නිකුත් කරනු ලබන අතර, ඉහත දීමනා සංශෝධනය 2023.01.10 දින සිට බල පැවැත්වේ.

කොමිෂන් සභා නියමය පරිදි,

එල්.පී. මනෝජා එස්. පතිරණ
ලේකම් (වැ.බ.)
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් : 1. ලේකම් පළාත් මාර්ග, ප්‍රවාහන හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප. ) - කා.දැ.ගැ.පි.
2. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.